**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික/ගනුදෙනුකරු ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතා අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන KFD මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම KFD මගින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් KFD හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් KFD හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 0114711411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ **පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී, අංක 46/58, නවම් මාවත, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: **(+94 (0) 114711411)** [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු | ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **අ) ඉතුරුම් ගිණුම්** | | | | |
| **නේෂන්ස් මැක්ස් බෝනස් ඉතුරුම් ගිණුම**<br><br>මෙය පොලී ගෙවනු ලබන ගිණුමකි. මෙම ගිණුම, ගනුදෙනුකරුවන්ට ගිණුමේ පවත්වාගෙන යන ශේෂයන් මත බෝනස් පොලියක් ලබා දෙයි. | • පොලී අනුපාතය වසරකට (2.5%) කි. https://www.nationstrust.com/images/pdf/interest-rates.pdf<br><br>• ඉතුරුම් ශේෂය මත අයිරා පහසුකම.<br><br>• ගිණුමේ සිදු කරන ලබන ගනුදෙනු පිළිබඳ දැනුම්දෙන SMS සේවාව.<br><br>• මෙම ගිණුම සඳහා කාර්තුමය පදනම මත ගිණුම් ප්‍රකාශ නිකුත් කරනු ලැබේ.<br><br>• අන්තර්ජාල බැංකු, ජංගම බැංකු SMS බැංකු පහසුකම්.<br><br>• ඩෙබිට් කාඩ් පහසුකම. | • ගනුදෙණුකරුගේ ගිණුමේ ශේෂය රු.1,000 ට අඩු නම් රු100/- ක ගාස්තුවක් අය කෙරෙ.<br><br>• ගිණුම් වසා දැමීමේ ගාස්තුව.<br><br>• ඩෙබිට් කාඩ්පත් සදහා වාර්ෂික ගාස්තුව සහ සියලුම සම්මත ගනුදෙනු ගාස්තු.<br><br>• බැංකුවේ ගාස්තු ලේඛනයේ දක්වා ඇති අනෙකුත් සම්මත ගාස්තු සහ අයකිරීම්.<br><br>https://www.nationstrust.com/fees-and-charges-en | ඉතුරුම් ගිණුම් සඳහා බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍ර සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය:<br><br>• ජාතික හැඳුනුම්පතෙහි NIC / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>• ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සදහන් පදිංචි ලිපිනය වෙනස් නම් ලිපින තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. | සුදුසුකම් ලත් පුද්ගලයින්:<br><br>• වලංගු ජාතික හැඳුනුම්පතක් /විදෙස් ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්.<br><br>• අවම මූලික තැන්පතුව රු. 10,000 ක් විය යුතුය.<br><br>• සම්මත පොලිය සහ බෝනස් පොළිය බැංකුව විසින් කලින්කලට තීරණය කරන අනුපාතයටඅනුව එකතු කරනු ලබන අතර එය සංශෝධනයන්ට යටත් වේ.<br><br>• අනෙකුත් තැන්පතු නිෂ්පාදන වලට සමා නව රඳවා ගැනීමේ බද්ද WHT අදාළ වේ.<br><br>• බෝනස් පොලිය සඳහා සුදුසුකම් ලැබීමට නම් ගනුදෙනුකරු ගිණුමෙන් මසකට ලබා ගෙන තිබිය යුත්තේ එක් මුදල් ආපසු ගැනීමක් පමණි. නොඑසේනම් මුදල් ආපසු ගැනීම් කිසිවක් ලබා නොතිබිය යුතුය.<br><br>• වයස අවුරුදු 70 දක්වා ජීවිත ආවරණයට සුදුසුකම් ලබන අතර අසාධ්‍ය රෝග ආවරණය සඳහා සුදුසුකම් ලබන්නේ වයස අවුරුදු 60 දක්වා පමණි. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් නේෂන්ස් මැක්ස් බෝනස් ඉතුරුම් ගිණුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.

- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. https://www.nationstrust.com/fees-and-charges-en

- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බලපැවැත්විය යුත්තේ මෙහි ඉංග්‍රීසි පිටපතයි.

- මෙම බැංකුව, රු. 1,100,000/- ක් දක්වා තැන්පත් කරන එක් තැන්පත්කරුවෙකුට රක්ෂණය සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ (SLDIS) සාමාජිකයෙකු වේ.